# 3

# ක්‍රියා පද

නටමින්, ගය ගයා, *ඇවිදියි,* උයා, *වැටේ.*

ඉහතින් දක්වා ඇත්තේ පසුගිය පාඩමෙහි දී ඔබ උගත් නාම පද විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හෙවත් හැසිරීම් කිහිපයකි. ඒවා ක්‍රියා පද වශයෙන් නම් කළ හැකි ය. එම ක්‍රියා පද ඔබ උගත් නාම පද සමග යෙදෙන ආකාරය පහත උදාහරණ මගින් විමසා බලන්න.

1 මල්ලී නටමින් . . . 3 ගුරුවරයා *ඇවිදියි*

2 නුඹ ගය ගයා. . . 4 මම උයා. . . 5 ගස *වැටේ.*

මෙහි අංක එකෙන් දැක්වෙන'මල්ලී නටමින් . . .' යනු අසම්පූර්ණ වාක්‍ය ඛණ්ඩයක් බව පෙනේ. එය මල්ලී නටමින් ඇවිදියි, යනාදී වශයෙන් තවත් ක්‍රියා පදයක් එකතු වී සම්පූර්ණ විය යුතු ය. නැතිනම් වාක්‍යයේ නිමාවක් නැත. නුඹ ගය ගයා. . .හා මම උයා. . . යනු ද එවැනි ම අසම්පූර්ණ වාක්‍ය ඛණ්ඩ දෙකකි. එහෙත්,

3 ගුරුවරයා *ඇවිදියි.* 5 ගස *වැටේ.*

යනු තේරුමක් හා නිමාවක් සහිත සම්පූර්ණ වාක්‍ය දෙකකි. එහි යෙදුණු නාම පදවලට ඒ නිමාව හෙවත් පූර්ණත්වය ලැබුණේ අගට යෙදුණු ක්‍රියා පදයෙනි. එම ක්‍රියා පද අවසාන ක්‍රියා පද වශයෙන් හැඳින්වේ. අවසාන ක්‍රියා පද ආඛ්‍යාත පද වශයෙන් ද හැඳින්වේ. මෙම පාඩමේ දී අවධානය යොමු කරන්නේ එම අවසාන ක්‍රියා පද කෙරෙහි පමණි. ඉහත අසම්පූර්ණ වාක්‍ය ඛණ්ඩවල යෙදුණු නටමින්, ගය ගයා, උයා වැනි ක්‍රියා පදවලට අවසාන ක්‍රියා පද යැයි නොකියමු. ඒවා ඉදිරි කාලයේ දී ඉගෙනීමට ලැබෙනු ඇත. ඒ අනුව නාම පදයකට එකතු වී වාක්‍යයකට පූර්ණත්වයක් සමග ම නිමාවක් ලබා දෙන පද, අවසාන ක්‍රියා පද වශයෙන් සරල ව වටහා ගත හැකි ය.

නාම පදවලට හා ක්‍රියා පදවලට ද පොදු වර්ගකිරීම් සේ ම ක්‍රියා පදවලට පමණක් විශේෂ වූ බෙදීම් ද හැඳිනගත හැකි ය. ඕනෑ ම ක්‍රියා පදයක් සකසා ගන්නා මූලික ශබ්ද ගණනාවක් සිංහල භාෂාවේ ඇත. ඒ මුල් ම ශබ්ද ස්වරූපවලට 'ක්‍රියා ප්‍රකෘතිය' හෙවත් 'ධාතුව' යන නම යෙදේ. ලියයි යන්නෙහි 'ලිය' කපයි යන්නෙහි 'කප' ආදී වශයෙනි. ධාතුවකට විවිධ ප්‍රත්‍යය එකතු වීමෙන් ක්‍රියා රූප සෑදෙන බව සිත්හි තබා ගන්න.

ගුරුවරයා *ඇවිදියි.*

මෙහි 'ඇවිදියි' යන අවසාන ක්‍රියා පදයෙන් මේ මොහොතේ සිදු වන ක්‍රියාවක් පිළිබඳ කියවෙයි. එය අනාගතයේ වීමට ද ඉඩ තිබේ. මෙවැනි ක්‍රියා පද සම්බන්ධයෙන් වර්තමාන අනාගත වෙනස දක්වන්නේ, අනාගතය දැක්වීම සඳහා 'මතු' හෝ ' හෙට' යනාදි කාලයක් දැක්වෙන වචන ක්‍රියා පදය සමග යොදා ගැනීමෙනි.

උදා : ගුරුවරයා *මතු ඇවිදියි. /ඇවිදින්නේ ය.*
ගුරුවරයා *හෙට ඇවිදියි. /ඇවිදින්නේ ය.*

අවසාන ක්‍රියා පදයකට අතීත කාලයක් ද තිබේ.
උදා : ගුරුවරයා *ඇවිද්දේ ය.*

ආඛ්‍යාත පදවල ඒක වචන, බහු වචන භේදය මෙන් ම උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ යන පුරුෂ භේදය වැනි බෙදීම් ද තිබේ.

රකියි, රකිති යනාදි වශයෙන් මෙම ක්‍රියා පද සෑදීමට මුල් වන 'රක් ' යන මූලික ශබ්දය හෙවත් ධාතුව උදාහරණයට ගනිමු.

වර්තමාන කාලය

| | | *ඒක වචන* | *බහු වචන* |
|---|---|---|---|
| උත්තම පුරුෂ | : | රකිමි | රකිමු |
| මධ්‍යම පුරුෂ | : | රකිහි | රකිහු |
| ප්‍රථම පුරුෂ | : | රකියි | රකිති |

## අතීත කාලය

| | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| උත්තම පුරුෂ | : | රැකීමි | රැකීමු |
| මධ්‍යම පුරුෂ | : | රැකීහි | රැකුහු |
| ප්‍රථම පුරුෂ | : | රැකී | රැකූ |

## අනාගත කාලය

| | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| උත්තම පුරුෂ | : (හෙට) | රකිමි/රකින්නෙමි | රකිමු/රකින්නෙමු |
| මධ්‍යම පුරුෂ | : (හෙට) | රකිහි/රකින්නෙහි | රකිහු/රකින්නෙහු |
| ප්‍රථම පුරුෂ | : (හෙට) | රකියි/රකින්නේ ය | රකිති/රකින්නෝ ය |

අවසාන ක්‍රියා පද සකර්මක, අකර්මක වශයෙන් ද බෙදේ. සකර්මක යනු කර්මයක් සහිත යන තේරුම යි. එසේ ම 'කර්මයක් නැති' යන අරුත ඇති ව අකර්මක නම යෙදී තිබේ.

අකර්මක ක්‍රියා පද සඳහා පහත උදාහරණ පිරික්සන්න.

| | |
|---|---|
| මල්ලී වැටෙයි. | තරු පායයි. |
| කුකුළා හඬලයි. | වැස්ස වසියි. |
| තාරාවෝ ඉගිලෙති. | දරුවෝ හඬති. |

මේ වාක්‍යවල උක්ත වන නාම පදය හැර අවසාන ක්‍රියාවට යටත් වන වෙනත් නාම පද නැතහොත් කර්ම පදයක් නැත. එහෙත් වාක්‍යයේ අර්ථයට හානියක් ද නැත.

ඉහත උදාහරණ හය ම එවැනි අකර්මක ක්‍රියා පද සහිත ඒවා ය.

පහත වාක්‍ය දෙස බලන්න.

මල්ලී කයි. අක්කා ලියයි. නුඹ ඇසුවෙහි.

වාක්‍යයක යෙදී තනි ව ම පූර්ණ අදහසක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වන, ඒ සඳහා කර්ම පදයක් අපේක්ෂා කරන අවසාන ක්‍රියා පද හෙවත් ආඛ්‍යාත පද සකර්මක ක්‍රියා පද වේ.

ඉහත දැක්වූ අසම්පූර්ණ වාක්‍ය, කර්මයක් යොදා සම්පූර්ණ කළ හැකි ආකාර දෙක සසඳා බලන්න.

| | | |
|---|---|---|
| මල්ලී බත් කයි. | අක්කා ලිපියක් ලියයි. | නුඹ බණ ඇසුවෙහි. |
| මල්ලී කැවුම් කයි. | අක්කා මැල්ලුම් ලියයි. | නුඹ ගීයක් ඇසුවෙහි. |

අවසාන ක්‍රියා පදයක තවත් වර්ග කිරීමක් නාමාඛ්‍යාත යනුවෙන් දැක්වෙයි. නාමාඛ්‍යාත යන පදය දෙස බැලූ විට ම එය නාමයක් සහ ආඛ්‍යාතයක් යන වචන දෙක ම ඇතුළත් පදයක් බව පෙනේ. නාමයක් යනු කුමක් ද, ආඛ්‍යාතයක් යනු කුමක් ද කියා මේ වන විට ඔබ දන්නෙහි ය. නාමාඛ්‍යාත කිහිපයක් උදාහරණ ලෙස පහත දැක්වේ.

මම සිසුවියක්මි.
ඔහු ගුරුවරයෙකි.
ඌ කුරුමිණියෙකි.
උදේනි යුවතියකි.
එය පොතකි.
මෙය පෑනකි.
අන්නාසි පළතුරකි.

## කුසලතා වර්ධනයට:

1. බුද්ධ පූජා පැවැත්වීමේ දී ආහාර, ගිලන්පස, දැහැත්විට . . . යනාදි වශයෙන් ඔබ විසින් පූජා කරන ලද දේවල් වර්ග පහක් ඇතුළත් කර වාක්‍ය පහක් තනන්න.

2. බුද්ධ පූජා පැවැත්වීමේ දී ඉදිරි කාලයේ දී යම් යම් දේ පූජා කරමි, යන අදහසින් ඒ පූජා භාණ්ඩ සඳහන් කර වාක්‍ය 10ක් ලියන්න.

3. ඔබේ යහළුවන් හා හිතවතුන් ඔබ සමීපයේ නොමැති අවස්ථාවල දී යම් යම් වැඩවල, ක්‍රියාකාරකම්වල නිරත වන බව ඔබ දන්නෙහි ය. ඔබට නොපෙනුණත් ඔවුන් මේ අවස්ථාවේ දී කරමින් සිටිනවා ඇතැයි ඔබ සිතන ක්‍රියාවන් යොදා වාක්‍ය 10ක් නිර්මාණය කරන්න. එම වාක්‍ය වර්තමාන කාලයට අයත් වීම අවශ්‍ය ය.

   උදාහරණ : සෝභිත පොඩි හාමුදුරුවෝ දහම්පාසල් සිසුන්ට පන්සිල් දෙති.
   සෝමසිරි උපාසක මහතා දැහැත්විට සූදානම් කරයි.

4. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*"හිරු නැඟෙන හැටිත් බැස යන හැටිත් දිනපතා ම මම දකිමි. දහවල් වන විට අවට වාතය ගිනියම් වී මගේ පිට සම හිරු රැසින් රත් වෙයි. මා වසා සිටින අඳුරු වන ගැබ තුළින් සර සර ගාන හඬවල්, සිහින් කෙඳිරිලි දිවා රෑ දෙක්හි ම ඇසෙයි. <u>හිරු නැඟී එන විට දීප්තිමත් ව බබළන පහනකින් මෙන් ගන රන් ආලෝකයක් අහස පුරා පැතිර යයි.</u> කුඩා කඳු ගැට දෙකක් මා අසලින් පිහිටා සිටින්නේ දිවා රෑ නොතකා රැකවල් ලා සිටිනවුන් දෙදෙනකු මෙනි. ජේන තෙක් මානයේ හැම පැත්තෙන් ම කුඩා කඳු ගැට වසාගෙන ඝන වනය ඈතට විහිද යයි. එහෙත් ඈතින් පෙනුණු ඇතැම් උස කඳු මුදුන් නිලට හුරු කොළ පැහැයක් ගත්තේ ය. ඇතැම් කඳු මුදුන් ඇති බව වත් නොපෙනෙන තරම් ය. විටෙක වන හිස අඹරවාගෙන හමන තද සුළඟින් වන පෙදෙස ඝෝෂාවක් වෙයි. සුළං පහර කොතරම් දැඩි වුව ද මගේ ඇඟේ හැපී පැරද ආපසු කැරකී පළා යයි. වියළි පැරණි ගසක පිට සුඹුලු ගැලවෙන්නාක් මෙන් මගේ පිට සමින් පතුරු ගැලවී පා මුලට ඇද වැටෙයි. විශාල කුට්ටි ද වැටුණු අවස්ථා එමට ය."*

- සීගිරිය අවදියෙන් - *එල්. බී. හේරත්*



*නොමිලේ බෙදාහැරීම පිණිස ය.*

(අ) මෙම ඡේදයේ දැක්වෙන අවසාන ක්‍රියා පද හතක් තෝරා ලියා දක්වන්න.
(ආ) එම ක්‍රියා පද අතීත කාලයට හරවා ලියා දක්වන්න.
(ඇ) මෙම ඡේදයේ දැක්වෙන ඉරි ඇඳි වාක්‍යයෙන් කියවෙන අදහස විචිත්‍රවත් ව ඇඳ දක්වන්න.
(ඈ) මෙම ඡේදයේ දැක්වෙන නාම පද හතක් තෝරන්න.
(ඉ) මෙහි (අ) ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් තේරූ අවසාන ක්‍රියා පද හත සහ (ඈ) ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් තේරූ නාම පද හත සම්බන්ධ කර කෙටි වැකි හතක් තනන්න.

5. පහත සටහන කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

වඩු කුරුල්ලා



ගහක් ඉහළ ගෝටේ එල්ලෙන සැටිය
හොඳක් වෙයි දෝ කන්නෙට වඩුවගෙ සැටිය
මෙදක් වැස්ස ආවොත් වැඩි වැඩිය
කැඳක් මොකට කුඹුරේ අස්වනු වැඩිය



වඩු කුරුල්ලා කූඩු හදන්නේ සාමාන්‍යයෙන් වැව් ආශ්‍රිත ගස්වල යි. මේ කුරුල්ලන් ගහේ පහළ ම අතුවල කූඩු හදා ඇත්නම් ඉඩෝර කාලය වැඩි ය. මැද හරියේ නම් මධ්‍යස්ථ ඉඩෝරයකි. (යහපත් කාලගුණයක්) ඉහළ ම අතුවල නම් අධික වර්ෂාවක් ලැබේ. (බිත්තර රැකීම සඳහා ජලයේ ආර්ද්‍රතාව බලපායි. ආර්ද්‍රතාව අඩු වීමටත් හොඳ නැත; වැඩි වීමටත් හොඳ නැත. අවශ්‍ය නියමිත තත්ත්වය රැක ගැනීමට මේ කුරුල්ලෝ මෙම උපක්‍රමය භාවිත කරති.)

- සොබාදහම් ගොවිතැන - *පරිසරවේදී තිලක් කන්දේගම*

අ) '... ගෝටේ එල්ලෙන සැටිය' යනුවෙන් කුමක් අදහස් වේ ද?

(ආ) 'කැඳක් මොකට කුඹුරේ අස්වනු වැඩිය' යන කවි පේළියේ අදහස සොයා ලියන්න.

(ඇ) මෙම ඡේදයේ දැක්වෙන පරිදි ඉදිරියේ දී ඉඩෝරයක් පැමිණේ නම් වඩු කුරුල්ලා කූඩුව තනන්නේ කොයි ආකාරයෙන් ද?

(ඈ) වඩු කුරුල්ලාට ඒ නම ලැබී ඇත්තේ කුමක් නිසා දැයි විමසා දැනගෙන ලියා දක්වන්න.

(ඉ) වඩු කුරුලු කූඩුවක් නිරීක්ෂණයෙන් මේ කුරුල්ලා කූඩු තැනීමේ දී දක්වන නිර්මාණාත්මක දක්ෂතා කිහිපයක් සඳහන් කරන්න.

(ඊ) වැස්ස පිළිබඳ පෙරනිමිති පෙන්වන වෙනත් සතුන් කිහිප දෙනකුගේ නම් ලියන්න.

(උ) පහත වැකිවල අවසාන ක්‍රියා පද තෝරන්න.

1. හදිසි වැස්සකට පෙර කළු කුඹි සිය බිත්තරත් රැගෙන මිනිසුන්ගේ නිවෙස්වලට පැමිණෙති.
2. කපුටු කූඩුවේ බිත්තර දෙකකට වඩා වැඩි නම් වැඩි වැස්සක් ලැබේ.
3. හලංපෙන්දා සහ අවිච්චියා දුටු විට වැස්ස ළඟ බව ගොවියෝ දනිති.
4. කක්කුටු වළවල් පරීක්ෂා කිරීමෙන් ඉදිරියේ දී කොපමණ ප්‍රමාණයක වැස්සක් ලැබේවි ද යන්න පැවසීමට තරම් දක්ෂ ගොවියෝ සිටිති.
5. නියඟයක් පවතින තාක් නියඟලා, අල වශයෙන් ම පවතී.